ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Press Notice No: HRC/P/i/S/02/07/25

# මාධ්‍ය නිවේදනය

**මානව හිමිකම් කොමිෂන් සභාව සිය නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පවතින නීතිමය බැඳීමක් නැවත අවධාරණය කරයි**

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ පවත්වන ලද විමර්ශනවලින් පසුව නිකුත් කරන ලද කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සියලුම රාජ්‍ය ආයතන සතු නීතිමය බැඳීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නැවතත් අවධාරණය කරයි. 2025 ජූනි 19 වන දින, කොමිසම සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට, සංස්ථා ප්‍රධානීන්ට සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට මෙම බැඳීම මතක් කරමින් නිල සන්නිවේදනයක් නිකුත් කළේය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වගන්තියට අනුව, රාජ්‍ය ආයතන තමන් වෙත යොමුවන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර පිළිබඳව කොමිසමට දැනුම් දිය යුතු අවසාන දිනයක් නියම කිරීමට මානව හිමිකම් කොමිෂන් සභාවට බලය ඇත. මෙම අවශ්‍යතාවය ඉටු කිරීමට සියලුම රාජ්‍ය බලධාරීන්ට නීත්‍යානුකූලව බැඳී පවතී. තවද, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 17/2005 මගින් මානව හිමිකම් කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහතික කරන ලෙස රාජ්‍ය ආයතනවලට ද නියෝග කරයි.

මෙම පැහැදිලි බැඳීම් තිබියදීත්, නිර්දේශයකට එරෙහිව 'අභියාචනයක්' පවතින බව පවසමින් ඇතැම් ආයතන සහ නිලධාරීන් තම නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් වැළකී සිටීම කොමිසම කනස්සල්ලෙන් යුතුව සටහන් කරයි. තම නිර්දේශවලට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට පනත යටතේ නීතිමය විධිවිධානයක් නොමැති බව කොමිසම තරයේ ප්‍රකාශ කරයි. බැවින්, නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම සාධාරණීකරණය කිරීම සඳහා 'අභියාචනයක්' යන සංකල්පය භාවිතා කිරීම පදනම් විරහිත සහ නීති විරෝධී ය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සියළුම රාජ්‍ය ආයතන සහ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ තම නීතිමය රාජකාරිවලට අනුකූල වන ලෙසත්, කොමිසමේ වරමට ගරු කරන ලෙසත්, ශ්‍රී ලංකාවේ සියලුම පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියා කරන ලෙසත්ය. කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සිදුවනු ඇත.


නිහාල් චන්ද්‍රසිරි

මාධ්‍ය ප්‍රකාශක/අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ අංශය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.


02.07.2025


දුරකථන අංකය : 011 2505595

විද්‍යුත් තැපැල් ලිපිනය : rm.director.hrcsl@gmail.com